මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2020.11.21 |

# ශ්‍රී ලංකා මහ බැංකුවේ කටයුතු අඛණ්ඩ ව ඉදිරියට

ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවකයකු කොවිඩ්-19 ආසාදනයට ලක් වී ඇති බව 2020 නොවැම්බර් 19 වන දින අනාවරණය විය. ඔහු මේ වන විට වෛද්‍ය ප්‍රතිකාර යටතේ පසුවෙයි.

මේ බව අනාවරණය වූ වහා ම වෛරසය පැතිර යෑම වැලැක්වීම සඳහා අවශ්‍ය සියලු කඩිනම් ක්‍රියාමාර්ග ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගෙන ඇත. මහ බැංකු මූලස්ථාන පරිශ්‍රය පූර්ණ හා දැඩි විෂබීජහරණයකට ලක් කිරීම, ආසාදිතයාගේ සමීප ආශ්‍රිතයන් පීසීආර් පරීක්ෂණ සඳහා යොමු කිරීම මේ වන විටත් සිදු කොට අවසන් ය. එම පරීක්ෂණ අනුව ආසාදිතයා හැර අන් කිසි ම නිලධාරියකුට වෛරසය ආසාදනය වී නොමැති බව තහවුරු වී තිබේ. නමුත් පූර්ව ආරක්ෂණ ක්‍රමවේදයක් ලෙස ආසාදිතයා අනාවරණය වූ දින දක්වා ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රධාන කාර්යාලයේ සේවය කරමින් සිටි ජ්‍යේෂ්ඨ නිලධාරීන් සියලු දෙනා ම 2020 නොවැම්බර් 20 වන දා සිට සති දෙකක කාලයක් නිවසේ සිට සිය සේවා සපයනු ඇත.

සිය සේවකයන්ගේ සහ මහ බැංකුව වෙත සේවා ලබා ගැනීමට එන මහජනතාවගේ ආරක්ෂාව ඉහළ ම ප්‍රමුඛත්වයේ ලා සලකන ශ්‍රී ලංකා මහ බැංකුව, වෛරස ආසාදනය වලක්වා ගැනීම සඳහා අවශ්‍ය සියලු ම සෞඛ්‍ය මාර්ගෝපදේශ නියමාකාරයෙන් අනුගමනය කරන බව අවධාරණය කර සිටී.

මෙවන් හදිසි අවස්ථාවක දී පවා ශ්‍රී ලංකා මහ බැංකුවේ කටයුතු බාධාවකින් තොර ව පවත්වාගෙන යෑම සඳහා මග පෙන්වීමේ අරමුණින් "හදිසි ක්‍රියාකාරී කාර්යසාධක බලකායක්" පිහිටුවා ඇති අතර, මනා සැලසුමකින් යුත් "ව්‍යාපාර අඛණ්ඩතා සැලසුමක්" ද ක්‍රියාත්මක වේ. ඊට අමතර ව සෞඛ්‍ය බලධාරීන්ගේ උපදෙස් අනුව අවශ්‍ය අනලස් ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා අතර, වරින්වර කෙරෙන මංගත සමීක්ෂණ මගින් සේවකයන්ගේ සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කිරීම, සේවා මුර ලැයිස්තු ක්‍රම යටතේ සේවකයන් රාජකාරි සඳහා කැඳවීම, සේවකයන්ට නිවෙස්වල සිට සිය රාජකාරි ඉටු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම ද ඒ අතර වේ.

මෙම තත්ත්වයන් යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ අත්‍යවශ්‍ය සේවා සියල්ල කිසිදු බාධාවකින් තොර ව අඛණ්ඩ ව පවත්වාගෙන යන බව මූල්‍ය වෙළෙඳපොළ සහ මහජනතාව වෙත ශ්‍රී ලංකා මහ බැංකුව දන්වා සිටියි.

cbslgen@cbsl.lk සහ fcrd@cbsl.lk යන විද්‍යුත් ලිපියනයන් ඔස්සේ ද, 0112 477 966 හෝ කලින් දන්වා ඇති දුරකථන අංක ඔස්සේ ද මහජනතාවට ශ්‍රී ලංකා මහ බැංකුව හා සම්බන්ධ විය හැකි ය.